**පොල් සංවර්ධන අධිකාරිය - 2022**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පොල් සංවර්ධන අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ , 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 88 ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ "දේපළ පිරියත උපකරණ" ලෙස ඉදිරිපත් කළයුතු ධාරණ අගය රු.707,590,167ක් වූ ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, මෝටර් වාහන හා අනෙකුත් උපකරණ සදොස් ලෙස "ස්ථාවර වත්කම්" ලෙස නම්කර තිබුණි. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදුණතෙහි "ස්ථාවර වත්කම්" ලෙස දක්වා ඇති අයිතම සියල්ලම "දේපළ පිරියත උපකරණ" ලෙස හැඳින්වීමේ නාමය වෙනස්කර 2023 වසරේ සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතියෙහි උපදෙස් ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණතෙහි රේඛීය අයිතමයන් නිවැරදිව දැක්විය යුතුය. |
| (ආ)නව ආයෝජන සිදුකිරීම හා ආයෝජන මුදල් කිරීම මුදල් ප්‍රවාහයේ ආයෝජන ක්‍රියාකාරකම් තුළ වෙන් වෙන්ව දැක්විය යුතු වුවද රු.645,618,450ක් වටිනාකමැති ස්ථාවර තැන්පතු සිදුකිරීම හා රු.633,429,118ක් වටිනා ස්ථාවර තැන්පතු මුදල් කිරීම එසේ හෙළිදරව් නොකර එම ශේෂ දෙකෙහි ශුද්ධ අගය වූ රු.12,189,332ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ලැබීම් හා ගෙවීම් ශුද්ධ අගය පමණක් පෙන්වා ඇති අතර 2023 වසරේ සිට මුදල් ලැබීම් හා ගෙවීම් වෙන් වෙන්ව පෙන්වීමට පියවර ගනු ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් ලැබීම් හා ගෙවීම් වෙන් වෙන් වශයෙන් දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ)ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2 හි 9 ඡේදය ප්‍රකාරව මාස 03ක් හෝ ඊට අඩු කාලයකින් කල් පිරෙන රු.186,144,876 ක් වටිනා ස්ථාවර තැන්පතු 13 ක් ද රු.3,472,558ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් 3ක්ද රු.57,264,130 ක් වටිනා ඉතුරුම් තැන්පතු 2ක්ද ඇතුළුව එකතුව රු.246,881,564 ක් මුදල් හා මුදල් සමාන දෑ ලෙස වර්ග කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීම වෙනුවට ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | මාස තුනෙන් තුනට කල්පිරී නැවත පොලිය සමඟ ස්වයංක්‍රීයව ආයෝජනය වන තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්, 2023 වසරේ සිට මුදල් හා මුදල් සමාන වත්කම් ලෙස පෙන්වීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතියෙහි නියමයන්ට අනුකූල ලෙස මුදල් හා මුදල් සමාන දෑ වර්ග කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කමක අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු ලී බඩු හා සවිකිරීම් රු.6,750,343 ක් ද , පරිගණක උපාංග රු.9,091,286 ක් හා යන්ත්‍රෝපකරණ රු.7,743,514 ක් එනම් එකතුව රු.23,585,143 ක් වූ ජංගම නොවන වත්කම් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනද ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරව ගැළපුම් කර ගිණුම් ගතකර නොතිබුණි. | විගණන විමසුමෙහි දක්වා ඇති පරිදි අදාළ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට අපොහොසත් වී ඇති බව පිළිගනිමු. මෙම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට පෙර වත්කම් හඳුනා ගැනීමේ ඇති වී ඇති ගැටළු කිහිපයක් මත මෙසේ ප්‍රත්‍යාගණනය කිරීමට ප්‍රමාද වී ඇත. | ප්‍රමිතියෙහි උපදෙස් ප්‍රකාරව සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණ නමුත් භාවිතයට ගනිමින් පවතින වත්කම්වල ඵලදායී ජීව කාලය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැළපීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 86 ඡේදය ප්‍රකාරව ක්ෂය වන වත්කම් වලට අදාළව ප්‍රයෝජනවත් ජීවිත කාලය හෝ භාවිතා කළ ක්ෂය අනුපාතිකය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත්, විද්‍යාගාර උපකරණ හා ආරක්ෂිත කැමරා උපකරණවල ක්ෂය අනුපාතයන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2023 වසරේ සිට “ රසායනාගාර උපකරණ ” සහ “ආරක්ෂිත කැමරා උපකරණ” වෙන වෙනම ශීර්ෂයන් දෙකක් යටතේ ක්ෂය අනුපාතය දැක්වීමට පියවර ගෙන ඇත. | ප්‍රමිතියෙහි නියමයන්ට අනුකූලව ක්ෂයවන වත්කම්වල ක්ෂය අනුපාත මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 12 හි 39 හා 40 ඡේදයන්ට අනුකූල නොවන පරිදි 99 අවුරුදු බදු පදනම මත අධිකාරියට ලබා දී ඇති ප්‍රත්‍යාගණන වටිනාකම වූ රු.340,000,000 ක ඩියුක් වීදියේ කාර්යාලයේ ඉඩම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කල්බදු වත්කම් වෙනුවට “ ඉඩම් ” ලෙස ගිණුම් ගත කර තිබුණි. කල්බදු වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම් කිසිවක්ද ගිණුම්වල සිදුකර නොතිබුණි. | 2022 වසරේ ජාතික විගණන කාර්යාලය විසින් පෙන්වා දි ඇති පරිදි මෙම ඉඩම කල්බදු වත්කමක් ලෙස නිවැරදි කර පෙන්වීමට අදාළ ගැලපීම් 2023 වසරේ සිට සිදු කිරීමට පියවර ගනු ඇත. | ප්‍රමිතියෙහි උපදෙස් ප්‍රකාරව කල්බදු වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (උ)1987 වර්ෂයේ සිට 99 අවුරුදු බදුපදනම මත ලබාගෙන තිබුණු පර්චස් 80ක රත්නපුර ඉඩම හා රු.121,544,000 ක තක්සේරු අගයක් සහිත නාරාහේන්පිට ප්‍රධාන කාර්යාල ඉඩම අධිකාරිය විසින් ගිණුම් ගත කර නොතිබුණි. | රත්නපුර පර්චස් 80 ඉඩම පිළිබඳ අනාවරණය කර ගැනීම සිදුකර ඇත්තේ 2023 වසරේ පෙබරවාරි මසය. මේ සම්බන්ධව තවදුරටත් තහවුරු කිරීම් කර ගැනීමෙන් හා නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩමද 99 අවුරුදු බදු ලෙස 2023 වසරේ සිට මූල්‍ය ප්‍රකාශනවල පෙන්වීමට පියවර ගනු ඇත. | ප්‍රමිතියෙහි උපදෙස් ප්‍රකාරව කල්බදු වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඌ)ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 හි 13 වන ඡේදයට අනුව වත්කම් හා ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්ථිත්වයට ගලා ඒම අපේක්ෂා කළ හැකි විට ජීව විද්‍යාත්මක වත්කමක් ලෙස | විගණන විමසුමේ සඳහන් කර ඇති පරිදි අධිකාරිය විසින් ජීව විද්‍යාත්මක වත්කම් මෙතෙක් කල් ගිණුම්ගතකර නොමැත. 2023 | ප්‍රමිතියෙහි උපදෙස් ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය |

| | | |
|---|---|---|
| හඳුනා ගත යුතු වුවද අධිකාරිය සතුව ඇති දුන්කන්නාව වත්තේ ඇති දැවමය වටිනාකමක් සහිත කොස් හා කුඹුක් ගස්ද තේක්ක ගස් 46ක්ද භෞතික සමීක්ෂණයෙන් හඳුනාගෙන තිබුණු නමුත් එම ගස්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයේදී ජීව විද්‍යාත්මක වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)කොටුව ඕයුක් වීදියේ පිහිටි බදු ඉඩම අධිකාරියට අයත් ඉඩමක් සේ සලකා ප්‍රත්‍යාගණනය කිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.36,050,400 විය යුතු ඉඩම් ප්‍රත්‍යාගණන සංචිතයේ වටිනාකම රු.355,682,930ක් වැඩියෙන් දක්වමින් රු.391,733,330ක් ලෙස වාර්තාකර තිබුණි. | වසර 30 කට අධික කාලයක සිට කොළඹ කොටුව ආදිපාද වීදියේ ගොඩනැගිල්ල පිහිටි ඉඩම අධිකාරිය සතු සින්නක්කර ඉඩමක් ලෙස ගිණුම්ගත වී තිබීමෙන් මෙම ගිණුම්කරණ අඩුපාඩුව සිදු වී ඇත. | මූල්‍ය ප්‍රකාශනවල මෙම ඉඩම සින්නක්කර ඉඩමක් ලෙස නොව බදු ඉඩමක් ලෙස ගිණුම්වල දැක්විය යුතුය. |
| (ආ) 2022 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණන වටිනාකම රු.220,464,200ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය අත්වැරදීමකින් රු.216,668,700ක් ලෙස දැක්වීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම රු.3,795,500ක් හා ගොඩනැගිලි ක්ෂය වටිනාකම රු.94,888 ක් අඩුවෙන් ගිණුම් ගත වී තිබුණි. | දුන්කන්නාව වත්තේ වෙනත් ඉදිකිරීම් ප්‍රත්‍යාගණිත වටිනාකම රු.33,795,500ක් ගිණුම්ගත කිරීමේදී මග හැරී ඇත. මෙම අගය 2023 වර්ෂයේ අවසාන ගිණුම් මඟින් ගැලපීමට කටයුතු කරනු ඇත. | සමාලෝචිත වර්ෂයට අදාළ ගොඩනැගිලි වටිනාකම හා ක්ෂය නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ)අපනයන කපාපු පොල් කිලෝග්‍රෑමයකට ශත 20 ක් බැගින් අපනයනකරුවන්ගෙන් අයකරගෙන මෝල් හිමියන් වෙනුවෙන් ආරම්භ කරන ලද ඉතුරුම් ගිණුම්වලට බැර කරමින් කපාපු පොල් කර්මාන්තශාලාවල සංවර්ධන කටයුතු සඳහා පොල් සංවර්ධන මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන අරමුදලින්, දිසිදි මෝල් සංවර්ධන අරමුදලට මුදල් බැර කිරීම සඳහා 2022 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණු එකතුව රු.5,128,893ක මුදල් එම අරමුදලට බැර කර නොතිබුණු බැවින් අරමුදලේ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම් ගත වී තිබුණි. එසේම මෝල් හිමියන් තිදෙනෙකු සඳහා ඉතුරුම් ගිණුම්ද ආරම්භ කර නොතිබුණි. | දිසිදි මෝල් හිමියන්ගේ ගිණුම් වෙත (මෝල් සංවර්ධන අරමුදල වෙත) මුදල් බැර කිරීම සිදු කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රාග්ධන අරමුදලිනි. 2022 වසරේ සිට ප්‍රාග්ධන අරමුදල් නොලැබීම මත මෙම ගිණුම් වෙත මුදල් බැර කිරම සිදුකර නොමැත. | සමාලෝචිත වර්ෂයට දිසිදි මෝල් හිමි ගිණුම් හා ඉතුරුම් ගිණුම්වලට අදාළ මුදල් එම ගිණුම්වල නිවැරදිව දැක්විය යුතුය. |
| (ඈ) 2022 දෙසැම්බර් 27 දිනැති අංක 609/ PD/02 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව මෝල් හිමිකරුවෙකුට ලෝහ අනාවරක යන්ත්‍රයක් ස්ථාපිත කිරීමට රු.681,312ක මුදලක් ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වී තිබුණු නමුත් 2022 වර්ෂයේදී එම මුදල ලබා දී නොතිබුණු අතර | 2022.12.12 දිනැති මාණ්ඩලික පත්‍රිකා 609/PD/02 අනුව M -105: DY හා DU රාජපක්ෂ දිසිදි නිෂ්පාදන ආයතනය සඳහා රු.681,312ක් මුදලක් ලබා දීමට ඉල්ලුම් කර, අදාළ අනුමැතිය | සමාලෝචිත වර්ෂයට අදාළ ගෙවිය යුතු වියදම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම් තැබීම ද සිදුකර නොතිබුණි. | 2022.12.27 දිනැති 607/15/2022 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මඟින් ලැබී ඇත. 517720 දරන චෙක්පත් අංකය මඟින් මෙම ගෙවීම සිදුකර ඇත්තේ 2023 වර්ෂයේ බැවින් 2022 වර්ෂයේ මෙම ගෙවීම සටහන් වී නොමැත. | |
| (ඉ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ “ කලින් ලැබූ අත්තිකාරම්” ලෙස රු.6,006,609ක ශේෂයක් දක්වා තිබුණද එම ආදායම් හඳුනාගෙන නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂය දක්වා ඉන්වොයිස් නිකුත් කිරීමේ යම් යම් අඩුපාඩු සිදුවූ අතර, විගණන හා කළමනාකරණ කමිටුව හා විගණන කාර්යාලය විසින් පෙන්වාදෙන ලද අඩුපාඩු මග හරවා ගනිමින් 2023 වර්ෂයේ සිට සේවාව සැපයීමට පෙර මුදල් අයකර ගැනීමේ ක්‍රමවේදය භාවිතා කරනු ඇත. | සමාලෝචිත වර්ෂයට අදාළ ගාස්තු ආදායම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඊ) 2022 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු යටතේ පවතින ලංකා බැංකුවේ මාස 03කින් කල්පිරෙන ගිණුම් අංක 89704304 සහ 89704323 හි ස්ථාවර තැන්පතු වටිනාකම පිළිවෙළින් රු.12,618,450 ක් සහ රු.50,000,000 ක් වුවද මූල්‍ය ප්‍රකාශන තුළ 2023 ජනවාරි 11 දිනට කල්පිරුණු වටිනාකම වන රු.13,313,398 ක් සහ රු.52,753,699ක් ලෙස වාර්තා කිරීම හේතුවෙන් ස්ථාවර තැන්පතු වටිනාකම රු.3,448,647කින්ද පොලී ආදායම රු.1,382,008කින්ද ලැබිය යුතු තැන්පතු පොලී ආදායම රු.2,066,639කින් ද වැඩියෙන් ගිණුම් ගත වී තිබුණි. | 2023-01-11 දින කල්පිරීමට නියමිතව තිබූ රු.62,618,450 ක් වටිනා ස්ථාවර තැන්පතු දෙකක් 2022-12-11 දින කල්පිරුණු ලෙස සලකා පොලී ආදායම ගණනය කිරීම මත එම වරද සිදු වී ඇත. | සමාලෝචිත වර්ෂයට අදාළ ආයෝජන පොලී ආදායම් හා ලැබිය යුතු ආයෝජන පොලී ආදායම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (උ) අධිකාරිය විසින් අනූනව අවුරුදු බදු පදනම මත ලබාගෙන ඇති කොටුව හා රත්නපුර ඉඩම් වෙනුවෙන් වාර්ෂිකව බදු මුදල් ගෙවීම් කර නොතිබුණු අතර බදු ගිවිසුම් අනුව නියමිත කාලයට බදුකුලී ගෙවීමට අපොහොසත් වුවහොත් පොලියක් සමඟ අදාළ බදු මුදල ගෙවිය යුතු වුවද නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේද 2020 වර්ෂයෙන් පසුව බදුකුලී ගෙවීම් කර නොතිබුණි. | 99 බද්දට ලබාගෙන ඇති නාරාහේන්පිට, කොටුව හා රත්නපුර ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු බදු කුලිය කොපමණද යන්න දන්වා එවන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වෙත ඉල්ලීම් කර ඇති අතර, අනතුරුව ගෙවීම් කටයුතු සිදු කිරීමට පියවර ගනු ඇත. නාරාහේන්පිට කාර්යාලයේ 2020 වර්ෂය දක්වා බදු කුලිය ගෙවා ඇත. | අධිකාරිය බදු පදනම මත ලබාගත් ඉඩම් වල බදු මුදල් නියමිත කාලයට ගෙවිය යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)අධිකාරියේ පොල් තෙල් මිල ස්ථායීකරණ අරමුදලෙන් හා ප්‍රාග්ධන සංවර්ධන අරමුදලෙන් සමාගමකට 1985 වර්ෂයේදී ලබා දී තිබුණු රු.26,715,037 ක ණය මුදලක් ද 2002 හා 2004 වර්ෂයන්හිදී ලබා දී තිබුණු රු.31,550,000 ක ණය මුදලක් ද එනම් එකතුව රු.58,265,037 ක් හා ණය පොලිය රු.60,174,135 ක් ද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් වසර 37කට අධික කාලයක සිට හිඟව තිබුණි. | මෙම සමාගමෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට දිගින් දිගටම කටයුතු කර ඇත. 2022 ජනවාරි මස සිට 2023.05.08 දින දක්වා මේ සම්බන්ධව විවිධ පියවරයන් ගෙන තිබුණද එම සමාගම ණය මුදල් හා පොලිය, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගෙවා නොතිබුණි. | නොපමාව අයවිය යුතු ණය හා පොලී මුදල් අයකරගත යුතුය. |
| (ආ) අධිකාරිය විසින් 2014 වර්ෂයේ ආරම්භ කළ පොල්කිරි, පොල්පිටි හා පොල් ක්‍රීම් නිෂ්පාදන පාරිභෝගික ජනතාව අතර ප්‍රචලිත කිරීමේ වැඩසටහන් සඳහා රූපවාහිනී සංස්ථාවට රු.9,344,832 ක මුදලක් ගෙවා රු.2,284,800 ක මුදලකට පමණක් ප්‍රචාරණයක් සිදුකර තිබුණු අතර රු.7,060,032 ක මුදල් අයකර ගැනිම හෝ ඒ සඳහා ප්‍රචාරණ කටයුතු සිදුකර ගැනීමට කටයුතු නොකර වසර 8කට අධික කාලයක සිට විවිධ ණයගැතියෝ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අධිකාරිය 2023 වර්ෂයේ අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් සිදු කිරීමට නියමිත රූපවාහිනි දැන්වීම් සඳහා මෙම මුදල භාවිතා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ලැබුණු අතර ඉදිරිපත් කළ යෝජනා ක්‍රියාත්මක කිරීමට එමගින් අනුමැතිය ලැබුණි. ඒ අනුව ජාතික රූපවාහිනී විකාශන කාල රාමුව ( TV Schedule) නැවත සකස්කර 2023 වර්ෂයේ ජූලි මස 25 දින සිට උක්ත වෙළඳ දැන්වීම් විකාශය කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. | 2014 වර්ෂයේදී ගෙවූ මුදලට සරිලන ප්‍රචාරණයන් ලබා ගැනීමට හෝ ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ)අධිකාරියේ ලියාපදිංචි වී ඇති පොල් මෝල් හිමියන්ගෙන් කපාපු පොල් පරීක්ෂණ ගාස්තු සහ ජල සාම්පල පරීක්ෂණ ගාස්තු සඳහා 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රු.5,814,594ක්ද කොහුබත් උපස්ථර පරීක්ෂණ සඳහා රු.211,938ක්ද නිෂ්පාදිත පොල්කිරි පරීක්ෂණ සඳහා 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රු.1,180,985ක්ද ඇතුළුව එකතුව රු.7,207,517 ක ගාස්තු සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි. | මෙම හිඟ ගාස්තු අතර සමහර ගාස්තු ඍජු තැන්පත් ලෙස ගෙවීම් සිදුකර ඇත. ඒවා හඳුනා ගැනීමට සහාය ලබාගැනීම පිණිස කර්මාන්තකරුවන් වෙත ලිපියොමු කර ඇත. සමහර කර්මාන්තකරුවන් මේ වර්ෂයේ ක්‍රියාකාරිත්වය අඩු මට්ටමකින් පැවතීම නිසා හිඟ ගාස්තු අයකරගැනීම ප්‍රමාද වී ඇත. | නොපමාව මෙම ශේෂ අයකරගත යුතු අතර සේවා සැපයීමට පෙර මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) 2017 මාර්තු 01 දිනැති අංක 546/F/01 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත සේවක ණය යෝජනා ක්‍රමයක් අධිකාරියේ සුභ සාධක සංගමය මගින් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාදී ඒ වෙනුවෙන් අධිකාරිය විසින් ලබාදුන් රු.2,007,438 ක මුදලක් වසර 5 ක කාලයක සිට සුභසාධක අරමුදලින් ලැබිය යුතු ශේෂයක් ලෙස | ලෝහෝර් ආර්යා අරමුදලට ලබාදෙන ලද ණය ක්‍රමය අහෝසි වීමත් සමඟ අධිකාරිය තුල ආරම්භ කර ඇති සුභ සාධන ණය යෝජනා ක්‍රමය ආරම්භ කිරීමට මෙම ණය මුදල ලබා දී ඇත. මෙම ණය යෝජනා ක්‍රමය අහෝසි වූ දිනක | නොපමාව අයවිය යුතු ණය හා පොලී අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම මුදල ලබාගැනීමට කටයුතු කරනු ඇත. | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 98,651,996 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 18,945,738 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 117,597,734 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආයෝජන පොලී ආදායම රු.67,390,693 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය 6 : 1 ක් වූ අතර පෙර වර්ෂයේදී එම අනුපාතයන් 3 : 1 ක් විය. 2022 වර්ෂයේදී කෙටි කාලීන බැංකු තැන්පතු වල වටිනාකම රු.844,677,850 ක් වීම මත ජංගම හා ක්ෂණික වත්කම් අනුපාත ඉහළ අගයක් ගෙන තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)අධිකාරියට අයත් කොටුව ඩියුක් වීදියේ වර්ග අඩි 17,866කින් සමන්විත මහල් 4කින් සමන්විත කාර්යාල ගොඩනැගිල්ල තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේදී රු.මිලියන 340කට තක්සේරු කර තිබුණි. මෙහි වර්ග අඩි 5,154කින් සමන්විත පළමු මහල 2018 වර්ෂයේ සිටද වර්ග අඩි 2,600කින් සමන්විත තෙවන මහල 2020 වර්ෂයේ සිට ඌන උපයෝජිතව පැවතුණි. මෙම පරිශ්‍රයේ ඉතිරි මහල් 2හි නිලධාරින් 49කින් සමන්විත අංශ තුනක් පවත්වාගෙන ගොස් තිබුණි. අධිකාරියේ ප්‍රධාන කාර්යාලයද වර්ග අඩි 27,531ක ගොඩනැගිල්ලක නාරාහේන්පිට පවත්වාගෙන යනු ලබයි. රු.මිලියන 340ක පමණ වාණිජමය වටිනාකමක් සහිත මෙම පරිශ්‍රයේ අතිරික්ත ඉඩකඩ ප්‍රයෝජනවත් කාර්යයකට යෙදවීමට කටයුතු කර නොතිබුණි. | අධිකාරියේ කාර්යයභාරය අනුව ප්‍රධාන අංශ 05කින් සමන්විත අතර, ඉන් පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන්ගේ අවශ්‍යතා ඉටුකරලීමට වඩාත්ම දායක වන අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය හා සැකසුම් සංවර්ධන අංශය කොටුව කාර්යාලීය ගොඩනැගිල්ලේ ස්ථාපනය කර ඇත. ඊට අමතරව අභ්‍යන්තර විගණන අංශය හා පුස්තකාලයද මෙම ගොඩනැගිල්ලේ ස්ථාපනය කර තිබුණි.<br>මෙම කාර්යාලීය ගොඩනැගිල්ලේ බිම් මහලේ ව්‍යාපාර සේවා මධ්‍යස්ථානයක් ස්ථාපනය කර ඇති අතර බිම් මහලේ මේ වන විට තොරතුරු තාක්ෂණ ඒකකය, සැලසුම් ඒකකය, මාධ්‍ය ඒකකය, පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක්, සභාපති කාර්යාලය හා සභාපති ලේකම් කාර්යාලය ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත. | වත්කම්වලින් උපරිම ප්‍රයෝජන ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ)පොල් නිෂ්පාදනයන්හි අඩංගු සීනි මට්ටම, විටමින් මට්ටම (PAH) පරාමිතිය පරීක්ෂා කිරීමත්, අපනයනය කරනු ලබන කපාපු පොල්වල හා පොල්තෙල්වල SLS 98: 2013 ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුව පවතින ඇෆ්ලටොක්සින් පරීක්ෂා කිරීමත් අරමුණු කරගෙන 2017 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා රු.15,574,140ක් වැයකර මිලදීගත් High Performance Liquid Chromo to graph (HPLC) යන්ත්‍රය මිලදීගත් දින සිටම දෝෂ වාර්තා වී තිබීම හා රසායනාගාරයේ නවීකරණ කටයුතු අවසන්ව නොතිබියදී යන්ත්‍රය මිලදීගැනීම සහ විශ්ලේෂක සේවක පුරප්පාඩු පැවතීම යනාදී කරුණු මත යන්ත්‍රය නිෂ්ක්‍රීයව තිබූ අතර 2018 වර්ෂයේදී යන්ත්‍රයේ වගකීම් කාලය ද අවසන් වී තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට පරීක්ෂණ 83ක් පමණක් සිදුකර තිබුණි. | දිසිදි පොල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිතිය (SLS 98:2013) 2013 වසරේදී සංශෝධනය වූ අතර Aflatoxin පරාමිතිය මුල් වරට ඇතුළත් කර ඇත. එහි නිර්දේශිත ක්‍රමය වන්නේ HPLC උපකරණය භාවිතයෙන් Aflatoxin පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයයි. ඒ අනුව 2016 වර්ෂයේදී අධිකාරියට මෙම HPLC උපකරණයක් මිලදී ගෙන ඇත. මෙම කාලසීමාවේදී රසායනාගාරයේ සිදුකරනු ලැබූ නඩත්තු කටයුතු හේතුවෙන් ස්ථිර ලෙස එය සවිකර ගැනීමේ ගැටළු මතු වී ඇත. 2019 වර්ෂයේ නවීකරණ කටයුතු නිමවුවද ඒ වනවිට පැවති අධික සේවක පුරප්පාඩු හේතුවෙන් මෙම පරීක්ෂණ සිදුකිරීම සඳහා කාර්යක්ෂම ලෙස මෙම උපකරණය භාවිතා කිරීම නොහැකි වී ඇත.<br>ප්‍රමිතීන්හි ඇතුලත් වී ඇති පරීක්ෂණ සිදුකිරීම සඳහා HPLC උපකරණය භාවිතා කිරීමේ හැකියාව පවතින නමුත් අධිකාරිය විසින් මෙම නිෂ්පාදන සම්බන්ධයෙන් ඍජු නියාමනයක් සිදුනොකරන බැවින් මෙම පරීක්ෂණ සඳහා ඉල්ලුම් ලැබී නොමැත. | භාවිතා කිරීමට සුදුසු පසුබිමක් නොතිබියදී සිදුකළ මෙම ප්‍රසම්පාදනයට අදාළව පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |
| (ඇ) පොල් වගාකිරීමේ මණ්ඩලයේ පොල් වගාව සඳහා වන අත්පොත ප්‍රකාරව පොල් පැල සිටුවීමෙන් පසු මාස 06කට වරක් පොහොර යෙදිය යුතු වුවද අක්කර 25ක වගාවකින් යුත් දුන්කන්නාව පොල් වත්ත සඳහා අවසන් වරට රසායනික පොහොර යෙදීම 2020 ඔක්තෝම්බර් 13 දින සිදුකර තිබුණි. ඒ අනුව දුන්කන්නාව වත්තේ පොල් ගස් 1,147 ක මුර 8ක එලදාව 2021 වර්ෂයේදී පොල් ගෙඩි 72,460 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ එය 65,365ක් වී තිබුණු අතර 2021 වර්ෂයට සාපේක්ෂව සියයට 10 ක පමණ අඩුවීමක් බව නිරීක්ෂණය විය. | පාරිසරික සාධක හා දේශගුණික සාධක මත පොල් අස්වැන්න අඩු වැඩිවීම සිදුවේ. අදාළ වර්ෂවල දේශගුණික සාධක වගාවට උචිත මට්ටමක පැවතියද 2021 වර්ෂයේ පොහොර නොදීම මත, 2022 වර්ෂයේ අස්වැන්න අඩුවී ඇත. | පොල් වගාවන් සඳහා නිසි කාලයේදී පොහොර යොදා අස්වැන්න වර්ධනය කර ගැනීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)කොහු කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම හා භාවිතා වන යන්ත්‍ර සූත්‍ර හා නිෂ්පාදන විධික්‍රම සම්බන්ධයෙන් කර්මාන්තකරුවන්, නව ව්‍යවසායකයින්, ශිෂ්‍ය ප්‍රජාව ආදීන් සඳහා පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් 2006 වර්ෂයේදී දූන්කන්නාව කොහු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය ආරම්භකර තිබූ අතර කොහු නිෂ්පාදන ක්ෂේත්‍රයට නව දැනුම හා තාක්ෂණය ලබාදෙමින් තත්ත්වයෙන් උසස් කොහු නිෂ්පාදන හඳුන්වාදීමේ පුරෝගාමියා බවට පත්වීම මෙමගින් අරමුණු කර තිබුණි. එසේ වුවද (2020 අගෝස්තු 26 දිනැති අංක CDA/PD/FM/2020/Program -003 දරන අධ්‍යක්ෂ - සැකසුම් සංවර්ධන වැ.බ.ගේ ලිපිය ප්‍රකාරව) බාහිර පාර්ශවයකට බදු දීමේ අරමුණින් 2020 සැප්තැම්බර් 01 දින සිට කොහු සංවර්ධනයට අදාළ කර්මාන්තශාලාවේ කටයුතු නවතා දමා තිබුණි. 2023 ජූනි 02 සිදුකරන ලද ස්ථානීය විගණන පරීක්ෂණය අනුව පුහුණු මධ්‍යස්ථානයේ කටයුතු නැවත ආරම්භ කිරීම හෝ කොහු කර්මාන්ත ශාලාව බාහිර පාර්ශවයකට බදු දීම හෝ සිදුකර නොතිබුණි. | 2022 වර්ෂයේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ප්‍රගති සමාලෝචන රැස්වීමේදී දූන්කන්නාව කොහු පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානය නැවත ආරම්භ කර ආදායම් ලබන තත්ත්වයට පත්කරන ලෙසත්, පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙසත්, රාජ්‍ය සහ පුද්ගලික හවුල්කාරීත්ව වැඩසටහනක් ලෙස සංවර්ධනය කිරීමට හැකි ශක්‍යතාවය අධ්‍යනය කර වාර්තා කරන ලෙසට උපදෙස් දෙන ලදි. ඒ අනුව, 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ මෙම මධ්‍යස්ථානයේ කොහු මෝල අවම පිරිවැයක් දරමින් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 2.48ක් වෙන්කරවා ගෙන අලුත්වැඩියා කටයුතු නැවත සිදුකිරීමට අනුමැතිය ලබාගෙන ඇත. | දූන්කන්නාව පුහුණු මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කිරීම හෝ සුදුසු වෙනත් වැඩපිළිවෙලක් යෙදීම තුළින් එම මධ්‍යස්ථානයේ කටයුතු සක්‍රිය කළ යුතුය. |
| (ඉ)පොල් ආශ්‍රිත කර්මාන්ත මඟින් අධිකාරිය වෙත සිදුකළ යුතු ගෙවීම් ගෙවීම් කවුළුවක් "Payment Gateway " මඟින් සිදු කිරීමට 603/DG/01 2022 මැයි 25 දිනැති අංක 607/09/03 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත 2022 නොවැම්බර් 23 දින සෙලාන් බැංකුවේ ජංගම ගිණුමක් ආරම්භ කර තිබුණද එම ගෙවීම් කවුළුව හරහා කිසිදු ගෙවීමක් 2023 මැයි මාසය දක්වා සිදුකර නොතිබුණි. | සෙලාන් බැංකුව හරහා ක්‍රියාත්මක කිරීමට යෝජිත " Payment Gateway " මඟින් මුදල් ලබා ගැනීමේ ක්‍රමවේදය මෙතෙක් ක්‍රියාත්මක වී නොමැතිමුත් ඉදිරියේදී අධිකාරියේ පරිගණක පද්ධතිය සකස් කිරීමෙන් අනතුරුව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර ඇත. | අධිකාරිය වෙත සිදුකළ යුතු ගෙවීම් සිදුකිරීමට ගෙවීම් කවුළුව සක්‍රිය කර ගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පොල් වතුර, පොල් නිෂ්පාදන කර්මාන්තශාලා වලින් පිට කරන අපජලය තුල තිබෙන සින්ක්, කොපර්, ලෙඩ් වැනි බැර ලෝහ හඳුනා ගැනීම සිදුකරන බැර ලෝහ පරීක්ෂා කිරීමේ උපකරණය (Atomic Absorption Spectrophotometer) 2022 ජූලි මස 15 දින සිට එම උපාංගයේ ඇතුළත් Nebulize උපාංගය දෝෂ සහිත වීම හේතුවෙන් අක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය. | මෙය වසර 17ක් පමණ පැරණි උපකරණයක් වන අතර රු.මිලියන 17,284 ක් මෙවන විට උපයා ඇත. 2023 පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී (COPE කමිටුවේදී) මේ සම්බන්ධව සාකච්ඡා කර ඇති අතර විධිමත් ලෙස උපකරණය අපහරණය කිරීම සඳහා COPE කමිටු නිර්දේශ ලබා දී ඇත. ඒ අනුව කටයුතු කිරීමට නියමිතය. | අක්‍රියව පැවති උපකරණ අපහරණය කිරීමට හා පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය නවීන උපකරණ සපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පොල්, කිතුල් හා තල් ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රයෝජනය සඳහා එහි පෞද්ගලික ලේකම් විසින් අධිකාරියේ සභාපතිගෙන් සිදුකරන ලද ඉල්ලීම මත අධිකාරියේ වාහනයක් ස්ථිර රියදුරෙකු සමඟ මුදාහැර තිබුණු නමුත් එම වාහනය ලිඛිතව අමාත්‍යාංශය වෙත පවරා දී නොතිබුණි. අදාළ කාලපරිච්ඡේදය තුළ මෙම වාහනය රාගම වෛද්‍ය විද්‍යාලයේ පැවති ගැටුමක් සඳහා යොදාගෙන තිබුණු බවද එම අවස්ථාවේ අධිකාරියේ තාවකාලික පදනම මත බඳවාගත් රියදුරෙකු විසින් වාහනය පදවා තිබුණු බවද විගණනයේදී නිරීක්ෂණය විය. තවද 2021 දෙසැම්බර් 04 සිට 2022 ජනවාරි 19 දක්වා කාලපරිච්ඡේදය තුළ කි.මී 719ක දුරක් අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම් හා අමාත්‍යාංශ නිලධාරින් ද මෙම වාහනය පරිහරණය කර තිබුණු බවද වැඩිදුරටත් නිරීක්ෂණය විය. | ගරු අමාත්‍යතුමා වෙත පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයට සම්බන්ධ කොළඹින් බැහැර අධීක්ෂණ රාජකාරි කටයුත්තක් සඳහා යෑමට වාහනයක් සම්බන්ධයෙන් වූ හදිසි අවශ්‍යතාවය මත සභාපති විසින් 2020.01.21 දින රාත්‍රියේ මෙම අධිකාරියේ රියදුරෙකු යොදවා ධාවන සටහන් පොත සමඟ රථය භාර දීමට කටයුතු කර ඇත. මෙම අධිකාරිය විසින් විෂයභාර අමාත්‍යතුමාගේ රාජකාරි අවශ්‍යතාවයන් සඳහා පමණක් මෙම වාහනය ලබා දී ඇත. | නීත්‍යානුකූල නොවූ මෙවැනි වාහන මුදාහැරීම සිදු නොකළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට ඩිජිටල් එළිමහන් වෙළඳ දැන්වීම් පුවරුවක් ඉදිකිරීමට රු.4,998,000ක කොන්ත්‍රාත්තුවක් ගිවිසුමකින් තොරව පෞද්ගලික ආයතනයකට 2021 ඔක්තෝබර් 06 දින ලබාදී රු.999,600ක අත්තිකාරම් ලබාදී තිබුණි. පිරිවිතරයන්ට අනුකූලව අදාළ කාර්යය නිමකර නොතිබුණු බැවින් මෙම දැන්වීම් පුවරුව ක්‍රියාත්මක නොකර නිෂ්කාර්යව පවතින අතර සැපයුම්කරුගෙන් ලබාගත් රු.249,900ක කාර්යසාධන බැඳුම්කරයේ කාලයද 2022 ජනවාරි 08 දින අවසන් වී තිබුණි. | පොල් සංවර්ධන අධිකාරිය හා පුද්ගලික සමාගමට උක්ත කාර්යය සැපයීම සම්බන්ධව ගිවිසුමක් පොල් සංවර්ධන අධිකාරිය පාර්ශවයෙන් ඉදිරිපත් කල අතර ඒ සඳහා සේවා සපයන පුද්ගලික සමාගම එකඟ නොවීය. මෙම කාර්යය අවසන්වන තෙක්ම ගිවිසුම සම්බන්ධව දෙපාර්ශවයම එකඟතාවයකට පැමිණීමට නොහැකි විය.<br>මෙම පුද්ගලික සමාගම ඉදිරිපත් කල කාර්ය සාධන සුරක්ෂිතය 2022.01.08 දින කල් ඉකුත් වී ඇතත් එම අවස්ථාව වන විට මුළු වැඩ ප්‍රමාණයෙන් 80% - 90% පමණ ප්‍රමාණයක වැඩ අවසන්ව තිබූ බැවින් දීර්ඝ කර ගැනීමට කටයුතු සිදුවී නොමැත. නමුත් එම කාර්යය භාරදුන් දින සිටම විවිධ අඩුපාඩු දක්නට ඇත. | කොන්ත්‍රාත්තුවේ කටයුතු සම්පූර්ණ කර ගැනීම හෝ ගෙවූ අත්තිකාරම් මුදල අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධයෙන් පොල් සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇති අධීක්ෂණ හා නියාමන කාර්යයන් ක්‍රමවත් කිරීම අරමුණු කරගෙන 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා මුද්‍රණය කරන ලද රු.11,639,811 ක් වටිනා ස්ටිකර් 6,588,831 කින් 2022 වර්ෂය අවසානය වන විටද සියයට 50 ක ප්‍රමාණයක් එනම් ස්ටිකර් 3,251,722ක් ඉතුරු වී තිබුණි. අවශ්‍යතාවය පිළිබඳ නිසි ඇගයීමකින් තොරව විශාල ස්ටිකර් තොගයක් එකවර මුද්‍රණය කර වසර ගණනාවක් ගබඩාකර තබා ගැනීමෙන් අධිකාරියේ මුදල් ඵලදායී නොවන ලෙස රඳවා ගෙන තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | ස්ටිකර් ආකාර ලේබල්, අධිකාරියේ නියාමන කටයුතු සඳහා සාර්ථකව භාවිතා කරනු ලැබේ. 2023.07.18 දිනය වනවිට අධිකාරිය තුල ඉතිරිව ඇති ලේබල් ප්‍රමාණය **1,733,870**කි. එය මෙම වසරේ ඉතිරි මාසද ඇතුලත්ව, ඊළඟ වර්ෂ දෙක තුලදී අලෙවිකර අවසන් කිරීමට හැකියාවක් ඇති බව ඇස්තමේන්තු කර ඇත. | මුද්‍රණය කරන ලද ස්ටිකර් උපයෝජනය කළ යුතුය. මෙවැනි කටයුතුවලට පෙර අවශ්‍යතාවය පිළිබඳ නිසි ඇගයීමක් සිදුකළ යුතුය. |

## 3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 පෙබරවාරි 12 දිනැති අංක 559/අලෙවි/05 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව අපනයනය කරන එක් තැඹිලි ගෙඩියකින් රු.5ක් හා 2021 අගෝස්තු 20 දිනැති අංක 595/අලෙවි/01 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව අපනයනය කරන එක් තැඹිලි ගෙඩියකින් රු.10ක්ද 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අයකරගෙන තැඹිලි ප්‍රවර්ධනය වෙනුවෙන් රු.127,578,524 ක් තවාන් ව්‍යාපෘති අරමුදලකට බැරකර තිබුණි. එම අරමුදලින් 2020 වර්ෂයේදී තැඹිලි ප්‍රවර්ධනය වෙනුවෙන් රු.මිලියන 25 ක මුදලක් පොල් වගාකිරීමේ මණ්ඩලයට ලබා දීම හා 2022 වර්ෂයේදී රු.1,456,000ක් ගෙවා බීජ පොල් 20,000ක් මිලදී ගැනීම හැර අරමුදලේ අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට අදාළ වෙනත් කිසිදු කාර්යයක් සිදුකර නොතිබීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට එම අරමුදලෙහි රු.101,122,525 ක ශේෂයක් පැවතුණි. එසේම පොල් වගාකිරීමේ මණ්ඩලයට ලබාදුන් රු.මිලියන 25 ක මුදලද අදාළ කාර්යයේ නොයොදවා සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා පොල් වගාකිරීමේ මණ්ඩලය පොල් සංවර්ධන අධිකාරිය හා පොල් පර්යේෂණ මණ්ඩලය යන ආයතනයන් වල සභාපතිවරුන් සමග කළ සාකච්ඡාවකට අනුව පොල් පර්යේෂණ මණ්ඩලයේ විශේෂ පැළ තවාන් ව්‍යාපෘතියකට මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමට පොල් සංවර්ධන අධිකාරිය අපේක්ෂා කර ඇත. | අරමුදල පිහිටුවීමේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා ඵලදායී වැඩපිළිවෙලක් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 259 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 187ක් විය. කාර්ය මණ්ඩල පුරප්පාඩු 72ක් වූ අතර ඒ තුළ අධ්‍යක්ෂ (පරිපාලන), අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන), අධ්‍යක්ෂ (අලෙවිකරණ ජාත්‍යන්තර) හා අභ්‍යන්තර විගණක යන තනතුරු ඇතුළත් වුවද එම පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. | අධ්‍යක්ෂ (පරිපාලන) තනතුර, අභ්‍යන්තර විගණක තනතුරු සඳහා පුවත්පත් දැන්වීම් පලකර ඇත. අධ්‍යක්ෂ සැකසුම් සංවර්ධන සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතය. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා නිලධාරින් බඳවා ගැනීමට විශේෂිත අනුමැතියක් ලබාගත යුතුය. |